**දේශීය ආදායම් දිරිගැන්වීමේ අරමුදල - 2019**

**-----------------------------------------------------------**

## 1.1 අහිතකර මතය

**----------------**

දේශීය ආදායම් දිරිගැන්වීමේ අරමුදල 2019 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් අරමුදලේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 අහිතකර මතය සඳහා පදනම

**------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා විසින් අහිතකර මතයක් නිකුත් කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ අහිතකර මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

-----------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති,

පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරිබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ. පොදු ලෙජරය, ජර්නලය, ජර්නල් වවුචර්, ගෙවීම් වවුචර් ආදී ප්‍රධාන ගිණුම්කරණ වාර්තා පවත්වාගෙන යාම සම්බන්ධ විගණන නිරීක්ෂණ පහත සඳහන් මාතෘකා යටතේ ඇතුළත් කර ඇත.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අරමුදලේ ආදායම් හා වියදම් නිසි පරිදි ගිණුම්ගත කිරීමේ ක්‍රම වේදයක් අනුගමනය කර නොතිබීම. | ගිණුම් තැබීමේ ගැටළුව සම්බන්ධයෙන් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කර ඇති බව සහ ඒ අනුව ඉදිරියේ දී අරමුදල් ගිණුම සකස් කිරීමේ අවශ්‍යතාව පැන නොනගින බව. | භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කර ගිණුම් තැබීමේ ක්‍රමවේදය කඩිනමින් විසඳා ගත යුතු බව. |

### 1.5.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කාර්යාල උපකරණ හා ක්‍රීඩා උපකරණ ක්ෂය කරනු ලබන අනුපාත මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. | අත් වැරදීමකින් ක්ෂය ප්‍රතිශතය අනාවරණය කිරීමට අතපසු වී ඇති බව. | මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමට පදනම් කර ගත් සියලුම ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන තුල අනාවරණය කළ යුතු බව. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දේශීය ආදායම් දිරි දීමනා සම්බන්ධයෙන් සිදු වන ගනුදෙනුවල ගිණුම් කටයුතුභාවය සඳහා අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු නමුත්, සමාලෝචිත වර්ෂය තුළ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ කාර්යමණ්ඩලයට දිරි දීමනා හා සුබසාධන වියදම් ගෙවීම සඳහා ලබා දී තිබුණු රු.955,000,000 ක මුදල සහ දිරි දීමනා හා සුබ සාධන වියදම් සඳහා දරන ලද එකතුව රු.898,391,258 ක වියදම අරමුදල යටතේ ගිණුම් ගත කර නොතිබුණි. මෙම සියලු ම ලැබීම් හා ගෙවීම්වලට අදාළ ගනුදෙනු අරමුදල සඳහා වූ පොදු තැන්පත් ගිණුමක් තුලින් සිදුකර තිබුණි. | ගිණුම් තැබීමේ ගැටළුව සම්බන්ධයෙන් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කර ඇති බව සහ ඒ අනුව ඉදිරියේ දී අරමුදල් ගිණුම සකස් කිරීමේ අවශ්‍යතාව පැන නොනගින බව. | භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කර ගිණුම් තැබීමේ ක්‍රමවේදය කඩිනමින් විසඳා ගත යුතු බව. |

### 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | | | |
| (i) ඡේදය 04.1 (අ) | වාර්ෂික අයවැය ලේඛනයක් සකස් කර විෂය භාර අමාත්‍යවරයාගෙන් අනුමැතිය ලබාගෙන නොතිබුණි. | සුවිශේෂී වූ පනතකින් අරමුදල ස්ථාපිත කර නොමැති බැවින් චක්‍රලේඛයට අනුව කටයුතු නොකළ බව | චක්‍රෙල්ඛයට අනුව කටයුතු කළ යුතු වීම හෝ භාණ්ඩාගාරයෙන් නිර්දේශයක් ලබා ගත යුතු බව. |
| (ii) ඡේදය 04.3 | ගිණුම් වර්ෂය අවසන් වී මාස 02 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන සමඟ කාර්යසාධන වාර්තාව විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. | චක්‍රෙල්ඛ උපදෙස් පරිදි 2019 වර්ෂය සඳහා කටයුතු කරන බව | චක්‍රෙල්ඛයට අනුව කටයුතු කළ යුතු බව. |

## 2. මූල්‍ය සමාලෝචනය

---------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.1,176,291 අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 1,116,585 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.59,706 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට පොලී ආදායම රු.57,564 කින් ඉහළ යාම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

--------------------------------------------------------------

ඉදිරිපත් කරන ලද ආදායම් වියදම් ගිණුම අනුව දිරි ගැන්වීමේ අරමුදලේ එකම ආදායම වූයේ රු.1,195,574 ක පොලී ලැබීම් වන අතර රු.19,282 ක ක්ෂය වීම් පමණක් වියදම ලෙස වාර්තා වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

-------------------------

### 3.1 කාර්යසාධනය

--------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 99 (1) වගන්තිය යටතේ දේශීය ආදායම් දිරි ගැන්වීමේ අරමුදල පිහිටුවා තිබුණ අතර පනතේ 99 (3) වගන්තිය ප්‍රකාරව අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද යෝජනා ක්‍රමයකට අනුව, නිලධාරීන්ගේ සුබ සාධන කටයුතු හා දිරිගැන්වීමේ කටයුතු සඳහා අරමුදල් යෙදවීම අරමුදලේ කාර්යයන් ලෙස දක්වා තිබුණි. එම කාර්යයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් වාර්ෂිකව විසර්ජනය කරනු ලබන මුදල, පනතේ 99 (2) වගන්තිය ප්‍රකාරව අරමුදලට ගෙවනු ලැබිය යුතු විය. එහෙත් පනතේ විධි විධාන ප්‍රකාරව කිසිදු කාර්යයක් සමාලෝචිත වර්ෂයේ දී අරමුදලින් සිදු කර නොතිබුණි. | විශේෂිත වූ පනතකින් අරමුදල පිහිටුවා නැති බැවින් පනතේ වගන්ති අදාළ නොවන බව. | පනතේ විධිවිධාන ප්‍රකාරව අරමුදල යටතේ කාර්යයන් සිදු කළ යුතු බව |
| (ආ) | 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 99 (4) වගන්තිය ප්‍රකාරව අරමුදල පරිපාලනය සඳහා කාර්ය පරිපාටියක් සකස් කර නොතිබුණි. | විශේෂිත වූ පනතකින් අරමුදල පිහිටුවා නැති බැවින් පනතේ වගන්ති අදාළ නොවන බව. | පනතේ විධිවාධාන ප්‍රකාරව කාර්ය පරිපාටියක් සකස් කළ යුතු බව. |

**3.2** **කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දේශීය ආදායම් දිරි ගැන්වීමේ අරමුදලට භාණ්ඩාගාරය විසින් වරින් වර ලබා දී ඇති මුදල් උකස් හා ආයෝජන බැංකුවේ තැන්පත් කර නිලධාරීන්ට නිවාස ණය ලබා දීමේ අරමුණින් නිවාස ණය අරමුදලක් පිහිටුවා තිබුණි. තැන්පත් මුදල් සහ එම මුදල ආයෝජනය කිරීම තුළින් වාර්ෂිකව උපයා ඇති පොලිය ඇතුළුව 2019 දෙසැම්බර් 31 දිනට නිවාස අරමුදලේ සමුච්චිත ශේෂය රු.36,502,151 ක් විය. එහෙත් සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය 05 ක කාලසීමාව තුල නිවාස ණය අරමුදලින් නිලධාරීන් සඳහා කිසිදු ණය මුදලක් ලබා දී නොතිබුණි. | ණය ශේෂ ගෙවා අවසන් වූ පසු ස්ථාවර තැන්පතුව මහා භාණ්ඩාගාරයට පැවරීමට කටයුතු කරන බව. | විධිමත් අධ්‍යනයක් සිදු කර තැන්පත් මුදල හා ණය යෝජනා ක්‍රමය පිළිබඳව ප්‍රතිපත්තිමය තීරණයක් ගත යුතු බව. |